# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2261/5 – 2022 ජනවාරි මස 03 වැනි සඳුදා – 2022.01.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟල උඩසිය පත්තුව පත්තුවේ දේවාලදෙණිය (හුමුපි 20 තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Ma/LGG/2019/151 හා 2010.08.19 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් පහත නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – තෝරයාය – ප්‍රමාණය: හෙක්. 0.4047**

උතුරට: හුමුපි 20 හි කැබලි අංක 8317 (මාර්ගය) සහ 8318; නැගෙනහිරට: හුමුපි 20 හි කැබලි අංක 8318, 8319, 8320 සහ 8321; දකුණට: හුමුපි 20 හි කැබලි අංක 8233, 7833 සහ 7834; බටහිරට: හුමුපි 20 හි කැබලි අංක 7834 සහ කැබලි අක්ෂර B.

02. **කැබලි අක්ෂර ‘B’ – තෝරයාය – ප්‍රමාණය: හෙක්. 0.1098**

උතුරට: හුමුපි 20 හි කැබලි අංක 7840 සහ 8317 (මාර්ගය); නැගෙනහිරට: හුමුපි 20 හි කැබලි අංක 8317 (මාර්ගය) සහ කැබලි අක්ෂර A; දකුණට: හුමුපි 20 හි කැබලි අංක 7834 සහ 7839; බටහිරට: හුමුපි 20 හි කැබලි අංක 7839.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: LD/05/2010/MV/51-B.
2021 නොවැම්බර් මස 02 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 01 – 0003


1A – G 35727 – 11 (2022/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*